**මිල්කො පුද්ගලික සමාගම - 2024**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිල්කො පුද්ගලික සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සාන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය අනුව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවන්ට පටහැනිව ණය හිමි ශේෂ, උපචිත වියදම්, නැවත ගෙවිය යුතු තැන්පතු ශේෂ තුළ ඇතුළත් වූ එකතුව රු.38,373,551 ක් වූ හර ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු නොකර බැර ශේෂයන්ට හිලව් කිරීම නිසා වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂයන් එම ප්‍රමාණයෙන් ද වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුළ තිබූ එකතුව රු.33,054,462 ක් වූ බැර ශේෂයන් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුනොකර හර ශේෂයන්ට එරෙහිව හිලව් කිරීම හේතුවෙන් වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ එම ප්‍රමාණයෙන්ද අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂයන් ගිණුම්කරණ දෝෂ මත හා දීර්ඝ කාලීනව ගිණුම් තුල පැවතගෙන ආ ශේෂ වේ. ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමටත් දීර්ඝ කාලීනව පවතින ශේෂයන් අවශ්‍ය අනුමැතීන්ගෙන් පසුව මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | අදාළ දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතු අතර වගකීම් සහ වත්කම් ශේෂ ප්‍රමිතියෙන් ඉඩ දෙන්නේ නම් හැර හිලව් නොකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 31 සහ 34 ඡේද අනුව වත්කම් ප්‍රත්‍යාගණනයකින් පසුව නැවතත් නිශ්චිත කාල සීමාවක් තුළදී වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකළ යුතු වුවද සමාගම විසින් 2008 වර්ෂයේදී සිදුකළ ප්‍රත්‍යාගණනයෙන් පසුව සමාලෝචිත වර්ෂය දක්වාම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණු අතර ඒ හේතුවෙන් | ඉදිරි මූල්‍ය වර්ෂයක් තුලදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට බලාපොරොත්තුවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වත්කම්වල කාලෝචිත වටිනාකම් ගිණුම් පොත්වල ඇතුළත් වී නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය අනුව වෙළඳ ණයගැති ශේෂය වන රු.1,083,193,368 ක් සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කළයුතු වුවත් එසේ ගණනය කිරීමකින් තොරව රු.55,790,443ක් හානිකරණ වෙන්කිරීම් සිදු කර තිබුණි. තවද අක්‍රිය ණයගැතියන්,වයස් විශ්ලේෂණය අනුව වසරකට වැඩි හා වසා දැමූ ආයතනයක ණයගැති වටිනාකමෙහි එකතුව රු.179,092,663ක් වෙනුවෙන් හානිකරණ ගැලපීම් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් හානිකරණ ගැලපීම්වල නිවැරදිතාවය හා බලපෑම නිශ්චිතව අගයකිරීමට නොහැකි විය. තවද එම ණය අයකරගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණයගැති ශේෂ විශ්ලේෂණය අවසන් වූ පසු සැසඳීම් කර අවසන් අයකරගත හැකි වටිනාකම් අයකරගැනීමටත් අයකර ගත නොහැකි වටිනාකම් ගිණුම් තුලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තුවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | පුද්ගලික ආයතනයකින් අවස්ථා කිහිපයක දී ලැබුණු එකතුව රු.11,886,564 ක් වූ ප්‍රදානය විලම්භිත ආදායමක් ලෙස වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගැනීම වෙනුවට ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනත් පාර්ශවයන්ට ගෙවිය යුතු ශේෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එය නිවැරදි කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 08 ප්‍රකාරව ගැලපුම් කිරීමකින් තොරව වර්ෂය තුළ ලද ප්‍රදාන ලෙස ගිණුම්ගතකර අදාළ සම්පූර්ණ මුදල ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය ලෙස දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකුවේ පවත්වාගෙන යන එක්සත් ජනපද ඩොලර් ස්ථාවර තැන්පතුවේ මුල් අර්ධ වර්ෂයට අදාළ පොලී ආදායම හා ස්ථාවර තැන්පතුව කල් පිරීමේදී ලද පොලී ආදායම ලෙස පිළිවෙළින් එ.ජ.ඩොලර් 238,250.30ක් | ඩොලර් ස්ථාවර තැන්පතුව කල්පිරෙන දිනය වන 2024 ජූලි 06 දිනට අදාළ පොලී ආදායම ගණනය කිරීමේදී විනිමය අනුපාතය ලෙස ඩොලර් වටිනාකම වෙනුවට වැරදීමකින් යුරෝ අනුපාතිකය | විදේශ විනිමය පරිවර්ථනය කිරීමේදී නිවැරදි විනිමය අනුපාතිකයන් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා එ.ජ.ඩොලර් 466,308.08 ක් රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේ දී වෙනස් විනිමය අනුපාතයක් යොදා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ආදායම් රු.6,393,467 කින් වැඩියෙන් දක්වා තිබු අතර තැන්පතු විනිමය අනුපාතිකය වෙනස්වීම මත 2024 දෙසැම්බර් 31 දිනට අලාභය රු.10,753,064 ක් වැඩියෙන් දක්වා තිබුණි. මේ අනුව සමස්ත අලාභය රු.4,359,597 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | යොදාගෙන තිබුණි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ දේපළ පිරියත හා උපකරණ අත්පත් කරගැනීම් රු.92,425,626ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ එය රු.80,539,062ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.11,886,564ක් අඩුවෙන් දැක්වුණි. | මෙම වෙනසට හේතුවී ඇත්තේ 2024 වසර තුල රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇති රු 11,886,564ක ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල දේපළ පිරියත උපකරණ මිලදී ගැනීමේ පිරිවැය තුල ගැලපීම් කර තිබීමය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙළ කළ යුතුය. |
| (ඇ) | සටහන් අංක 1.3.8 අනුව තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අවම අගයට ගණනය කළ යුතු වුවත් වර්ග 3 ක තොග සඳහා 2006 වර්ෂයේ සිට රු.12,096,362ක වෙන්කිරීමක් සිදුකර තිබුණද ඊට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. එසේ වෙන්කිරීම් කළ ද 2024 දෙසැම්බර් 31 දිනට අවසන් තොගය තුල දීර්ඝ කාලීනව පැවත එන භාවිතයට ගත නොහැකි තොග එකතුව රු.52,394,512ක් සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම් සිදුකර නොතිබුණි. තවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත්, 2018 වර්ෂයේ සිට පැවත එන පෞද්ගලික ආයතනයක් තුළ පවතින රු.42,255,235 ක්වූ තොගය සහ එකතුව රු. 30,062,931ක් වූ භෞතිකව නොපැවතුණු තොග සඳහා වෙන්කිරීම් හෝ හානිකරණ ගැලපීමක් සිදුකර නොතිබුණි.එසේම හිමිකාරීත්වය ආයතනය සතුව පවත්වා ගනිමින් ස්වයං පාලිත කිරි ගොවි සමිති වෙත නොමිලයේ බෙදාදුන් රු.9,871,432 කිරි සිසිලක තොගය බෙදාහැරීමට අදාළ | 2003-2006 තුල වෙන්කිරීම් කර ඇති විස්තර නොමැති තොග අනුමැතීන්ට යටත්ව මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වේ. ටියුනිප් ලංකා ආයතනයෙන් ඇසුරුම් සේවාවක් ලබාගත්ත ද 2020 වසරේදී අදාළ සමාගම වසාදැමීම හේතුවෙන් එම අවස්ථාවේ සිට ගිණුම් තුල පැවති තොග ශේෂයන් පවත්වාගෙනයාම සිදු කළ ද භෞතිකව නොපවතින බැවින් මූල්‍ය ප්‍රකාශනගත ශේෂ සඳහා ඉදිරි මූල්‍ය වර්ෂයකදී වෙන්කිරීමක් කිරීමට බලාපොරොත්තු වේ. ස්වයං පාලිත කිරි ගොවි සමිතිවල කිරි කල් තබාගැනීමේ අරමුණින් කිරි සිසිලක යන්ත්‍ර නොමිලයේ ලබාදී ඇත. මේ වන විට එම යන්ත්‍ර වලින් ඇතැම් යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. | තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අවම අගයට ගණනය කිරීමට හා හානි වූ තොග අලාභ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට පවතින තොගවල පැවැත්ම, සම්පූර්ණත්වය, වටිනාකම, හා අයිතිය සතුටුදායක ලෙස තහවුරු කරගත නොහැකි විය. | | |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වියදම් අයිතම 03 ක සහ ජංගම වත්කම් අයිතම 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අදාළ උපලේඛන/වවුචර් සහ ප්‍රේෂණ පත්‍රිකා අනුව ශේෂයන්ගේ රු.76,530,680 ක වෙනස්කම් පැවතුණි. | ප්‍රධාන කාර්යාලයේ කුලී වියදම් ගොඩනැගිලි අත්තිකාරම් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු598,543 ක වෙනසක්ද සභාපතිතුමාගේ නිල නිවසේ රු.160,000 ක කුලී වියදමද ගොඩනැගිලි කුලී වියදම තුල ඇතුළත් කර ඇත. වරද හඳුනාගෙන නිවැරදි කර ඇත. ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් මාර්ගස්ථ තොග වටිනාකමෙහි වෙනස ඇති වී ඇති අතර 2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.<br>පොල්ගහවෙල කර්මාන්තශාලාවේ ණයගැති ශේෂ විශ්ලේෂණයේ දී 2017 වර්ෂයෙන් පසු ණයගැතියන් පමණක් ඇතුළත් කර තිබීම හේතුවෙන් වෙනස හටගෙන ඇත. ඉදිරියේ දී අක්‍රිය ණයගැති ශේෂ ද ඇතුළත් කර ශේෂ විශලේෂණය සිදුකරනු ඇත. | ගනුදෙනු ගිණුම්ගත කිරීමේ දී මූලාශ්‍ර ලේඛණ අනුව ගිණුම්ගත කිරීම හා නිවැරදිතාවය පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවන ලද රු.4,699,557 ක අත්තිකාරම් සහ රාජ්‍ය ආයතන මගින් දීර්ඝකාලීනව ලැබිය යුතුව පවතින එකතුව රු.295,497,016 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මින් රාජ්‍ය ආයතන මගින් ලැබිය යුතු එකතුව රු.16,515,810 ක් සඳහා වෙන්කිරීම් කර නොතිබුණි. තවද එකතුව රු.36,751,412 ක්වූ ගෙවිය යුතු ශේෂ අයිතම 03ක් දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශ මගින් ලබාදීමට එකඟ වූ සහනාධාර වටිනාකමෙන් තව දුරටත් ලැබිය යුතු රු,287,981,206ක වටිනාකම සහ පාසල් ළමුන් සඳහා දියරකිරි වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය මෙසේ ගිණුම් තුල පවතී. ගෙවිය යුතු ශේෂ වලින් බහුතරයක් ගෙවීම් සිදු කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් නොවීම, ශේෂයන් නිරවුල් කිරීමට මූල්‍ය අංශය සතුව ප්‍රමාණවත් තොරතුරු නොපැවතීම බලපා ඇත. | රාජ්‍ය ආයතන මගින් දීර්ඝකාලීනව ලැබිය යුතුව පවතින ශේෂ සඳහා වෙන්කිරීම් සිදුකිරීම සහ ඒවා නිරවුල් කර ගැනීමට එම ආයතන සමඟ කටයුතු කිරීම සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කළ යුතුය. |
| (ඊ) | බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරය විසින් විදේශීය බැංකුවකින් ලබාගෙන තිබූ ණය මුදලින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා | ඉදිරියේදී මෙම ශේෂය තවදුරටත් ගිණුම් තුල පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය පිළිබඳව සලකාබැලීමෙන් පසු මෙම ශේෂ ඉවත් කිරීම සිදු කල යුතුනම් අවශ්‍ය | ණය මුදල ගිණුම්ගත කිරීම පිළිබඳ අදාල රාජ්‍ය ආයතන සමඟ එකඟතාවයක් ඇති කරගෙන ඒ අනුව |

| | | |
|---|---|---|
| වැයකළ රු. 12,641,310,517 ක් සමාගම විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය ලෙස 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණ ද භාණ්ඩාගාරය සමඟ ණය ගිවිසුමකට එළඹී නොතිබීම නිසා එම වගකීමේ බලපෑම හඳුනාගැනීමට නොහැකි විය. | අනුමැතීන්ට යටත්ව ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කටයුතු කල යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල (රු). | නොසැපයූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වෙළඳ හා අනෙකුත් ණයහිමි | 101,113,661 | ණයහිමි ශේෂ සනාථන | ශේෂ සනාථන සෘජුවම විගණන අංශයට ඉදිරිපත් කරන ලෙස සමාගම් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලදී. | ශේෂ සනාථන ලැබී නොමැති හෙයින් පැවැත්ම තහවුරු කිරීමට අදාළ වෙනත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වෙළඳ හා අනෙකුත් ණයහිමි | 500,840 | ආරම්භක ණයහිමි ශේෂ ලැයිස්තුව | නිරවුල් කිරීමට හෝ අවශ්‍ය අනුමැතීන්ගෙන් පසුව මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට බලාපොරොත්තුවේ. | ණයහිමි ශේෂ ලැයිස්තුව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ණයගැති හර සහ බැර ශේෂ | 79,737,898 (හර)<br>4,500,000 (බැර) | ණයගැති ශේෂ සනාථන | අදාළ ශේෂ සනාථන විගණන අංශය වෙත සෘජුවම ලබාදෙන ලෙසට ඉල්ලීම් කරමින් අදාළ ණයගැතියන් වෙතින් ලිඛිතව ඉල්ලුම් කර ඇත. | ශේෂ සනාථන ලැබී නොමැති හෙයින් පැවැත්ම තහවුරු කිරීමට අදාළ වෙනත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | තැන්පතු ශේෂ | 3,086,185 | තැන්පතු ශේෂ 94 ක ශේෂවල නිවැරදිභාවය තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන | ඇතැම් ශේෂ සඳහා මූල්‍ය අංශය සතුව තහවුරු ලේඛන පැවතියත් ඇතැම් ශේෂ සඳහා තහවුරු ලේඛන නොපවතී. | තැන්පතුවලට අදාළ මූලාශ්‍ර ලේඛණ ආරක්ෂිතව තබාගැනීම හා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | දිගුකාලීන ණය | 2,108,063 | ණය ශේෂය තහවුරු කිරීමට අවශ්‍ය ලේඛණ | අදාළ ශේෂ පිළිබඳව අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමෙන් අනතුරුව ඉදිරි මූල්‍ය වර්ෂයකදී ගිණුම් තුලින් ඉවත් කිරීමට කටයුතු කිරීමට බලාපොරොත්තුවේ. | ණය ශේෂය තහවුරු කිරීමට අවශ්‍ය ලේඛණ සුරක්ෂිතව තබාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වෙළඳ ලැබිය යුතු දෑ රු. 567,358,744කින් වැඩි වී තිබූ අතර ඉන් රු. 412,134,222ක් එනම් සියයට 73 ක් කොළඹ කර්මාන්තශාලාවට අයත් වී තිබුණි. මෙම ලැබිය යුතු ශේෂයන් වැඩි ප්‍රමාණයක් බැංකු ඇපකරයකින් තොරව ණයට විකුණුම් සිදුකරනු ලැබූ ආයතනවල ලැබිය යුතු ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. | 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වසරේ විකුණුම් ප්‍රමාණය ඉහළ යාම මත මෙම ණයගැති ශේෂ හටගෙන ඇත. | ණය අයකරගැනීමේ සුරක්ෂිතතාව ඇතිකර ගැනීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති මත බැංකු ඇපකර සහිතව ණයට විකිණීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ රු.7,473,222ක වෙළඳ ණයහිමි ශේෂයක් සහ ඊට අදාළ ණයහිමි ශේෂ සනාතනය අනුව ශේෂය රු.10,384,843ක් වූයෙන් රු. 2,911,621ක වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | අදාළ ණයහිමි සමාගමෙන් 2024 වර්ෂයේ දී ලද ඉන්වොයිස් 03 ක එකතු වටිනාකම රු.2,649,709 ක් මිල්කො සමාගම 2025 වර්ෂයේ දී ගිණුම්ගත කිරීම, ඉන්වොයිස් වටිනාකමක වෙනසක් පැවතීම සහ 2018-2020 වර්ෂවල ආරම්භක ශේෂ වෙනසක් පැවතීමට මීට හේතු වී ඇත. | අදාළ ණය හිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් 1998 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024 ජනවාරි 09 දින එකතුව රු.7,561,888ක් බදු පැහැර හැරීම් සහ දඩ පනවා තිබූ අතර එයින් රු.5,749,709ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. ඒ අනුව තවදුරටත් රු.1,812,179 ක් ගෙවිය යුතුව පැවතුණි. | නොගෙවා ඇති NSL හා SNC යන බදු හා සියළු බදු වෙනුවෙන් පනවා ඇති දඩ මුදල් ඉවත් කරගැනීම සඳහා ආදායම් බදු තක්සේරු නිලධාරීන් උපදෙස් දී ඇති ආකාරයට දිව්රුම් ප්‍රකාශන ලිපි සහිතව ඉල්ලීම් ලිපි ඉදිරිපත් කිරීමට සමාගම විසින් කටයුතු කර ඇත. | අදාළ ශේෂයන් නිරවුල් කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 8(1) වගන්තිය | නියමිත කාර්තුවට පසුව එළඹෙන මාසයේ 20 දිනට ප්‍රථම බදු වාර්තාව සම්පූර්ණ කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු වුවත් 2024 වර්ෂයට අදාළව එම වාර්තා නියමිත දිනට හෝ ඊට පෙර භාර දී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කාර්තු 04 ට අදාළ සමාජ ආරක්ෂණ බදු වාර්තා පිළිවෙළින් දින 37 ක්, දින 164ක්, දින 31ක්, දින10 ක් ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි. | සමාජ ආරක්ෂණ දායකත්ව බදු නියමිත දින ගෙවීමට කටයුතු කළ ද වාර්තා ඉදිරිපත් කිරීමේදී සිදුවූ අතපසු වීමක් හේතුවෙන් නියමිත දිනට ඉදිරිපත් කර නොමැත. | බදු පනත ප්‍රකාරව බදු වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොකිරීම තුළ වන දණ්ඩනයන් වළක්වා ගත යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශයේ 6.6. වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 257 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.63,934,508ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.469,384,394ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 405,449,886ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් වර්ධනය වීම, විකුණුම් වර්ධනයට සාපේක්ෂව බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සැලකිය යුතු ලෙස වර්ධනය නොවීම, මූල්‍ය වියදම් සාපේක්ෂව පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 කින් වර්ධනය වී තිබුණු අතර විකුණුම් පිරිවැය සියයට 4 කින් වර්ධනය වී තිබුණි. අනෙකුත් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 11 කින් වැඩි වී තිබුණු

අතර පරිපාලන වියදම්, බෙදාහැරීමේ වියදම් සහ වෙනත් වියදම් වල එකතුව සියයට 01 කින් වර්ධනය වීම සහ මූල්‍ය වියදම සියයට 11කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 12 ක් වූ අතර ශුද්ධ අලාභ අනුපාතය සියයට 0.4 ක් වී තිබුණි. එසේම කොටසක ඉපැයුම සමාලෝචිත වර්ෂයේදී සෘණ 0.08ක් වූ අතර පෙර වර්ෂයේදී එය සෘණ 0.55 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයට ඉපැයීමක් සිදු වී නොමැත. තවදුරටත් ආයතනයේ පවතින මෙහෙයුම් අකාර්යක්ෂමතාවය සහ දුර්වල කාර්යසාධනය සමාගමේ සමස්ත ප්‍රතිඵලය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ තෝලන අනුපාතය 0.74 ක් විය. එනම්, මුළු වත්කම්වලට සාපේක්ෂව සමාගමේ මුළු ණය ප්‍රමාණය සියයට 74 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී මෙම අනුපාතය සියයට 72 ක් විය. සමාලෝචිත වර්ෂයේ සමාගමේ මුළු ප්‍රාග්ධනයට ණය අනුපාතය 2.8 ක් විය. ඒ අනුව සමාගමේ ණය ප්‍රාග්ධනය ඉහළ අගයක පවතින බවත් වත්කම් මූල්‍යනය ණය ප්‍රාග්ධනය මත සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල, ලබුදූව කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකරණ ලේකම් විසින් 2024 ජූනි 01 දින සිට 2025 ජූලි 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සමිතියක් වෙතින් කිරි ලීටර් 22,216 ක් මධ්‍යස්ථානය වෙත ලැබුනා සේ ව්‍යාජ ලෙස සටහන් කර රු.4,296,509 ක් වැඩිපුර ගෙවා තිබූ බව අභ්‍යන්තර විගණන වාර්තාවකින් හෙළිදරව් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් ආරම්භ කර තිබුණද 2026 ජූනි 30 දින වන විටත් එම කටයුතු අවසන් වී නොතිබුණි. තවද මෙම සිදුවීමට අදාළව පොලීසිය වෙත පැමිණිල්ලක් සිදුකළ බවට තහවුරු කර ගැනීමට පැමිණිල්ලේ පිටපතක් ද විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම වංචාව සම්බන්ධව අක්මීමන පොලීසිය වෙත පැමිණිල්ලක් සිදුකර ඇති අතර වංචාව සිදුකළ බලමණ්ඩල ලේකම් අදාළ තනතුරෙන් හා ඒකාබද්ධ බලමණ්ඩලයෙන් ඉවත් කිරීමට ලබුදූව කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන බලමණ්ඩලය විසින් කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවීම පිළිබඳ විමර්ශනය මගින් වගකිව යුතු පුද්ගයන් හඳුනාගෙන නීතිය ක්‍රියාත්මක කර අදාළ මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමේ සියළුම සේවකයින්ට මාසිකව කිරිපිටි ග්‍රෑම් 400 පැකට් 05 බැගින් නොමිලයේ නිකුත් කරනු ලබන අතර අප්‍රේල් හා දෙසැම්බර් මාස වලදී නිකුත් කරනු ලබන කිරිපිටි | අප්‍රේල් හා දෙසැම්බර් මාසවල කිරි පිටි නොමිලයේ ලබාදීම සඳහා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ණ අනුමැතිය සහිතව සිදුකරන්නකි. ඒ අනුව එය මිල්කෝ සමාගමේ | නිෂ්පාදන පිරිවැය ආවරණය වන මිලක් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැකට් 04 ද ඇතුළුව එක් සේවකයෙකු සඳහා වර්ෂය තුළ කිරිපිටි පැකට් 64ක් නොමිලයේ නිකුත් කර තිබුණි. ඒ අනුව නොමිලයේ කිරිපිටි ලබාදීම හා සේවක ත්‍යාග මල්ල (hampers) නිකුත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සමාගම රු.79,767,632ක් වැයකර තිබුණි. තවද සමාගම අඛණ්ඩව අලාභ වාර්තා කර තිබුණ ද ඒ පිළිබඳ සමාලෝචනයකින් තොරව ඒ අයුරින් කිරිපිටි නොමිලේ නිකුත් කර තිබුණි. | උන්නතිය වෙනුවෙන් ක්‍රියාකරනු ලබන සේවක මණ්ඩලය වෙනුවෙන් මිල්කෝ සමාගම සිදුකරනු ලබන සේවක සුභ සාධනයකි. | |
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණු එකතුව රු.825,645,292 ක් වූ ගැටඹේ අලෙවි සැල ඉදි කිරීම, දිගන කිරි කර්මාන්ත ශාලාවේ අයිස් ක්‍රීම් කප් සහ කෝන් පිරවුම් යන්ත්‍රය ස්ථාපනය කිරීම, කර්මාන්තශාලාව නවීකරණය, ඉන්වොයිසි නිමවුම් පද්ධතිය සකස් කිරීම ආරම්භ කර දීර්ඝ කාලයක් ගත වී තිබුණද විගණිත දිනය වූ 2026 පෙබරවාරි 27 වන විටත් ඒවායේ කටයුතු සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි. | රු. මිලියන 15 කට අධික අයිස්ක්‍රීම් කෝන් පිරවුම් යන්ත්‍රයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා භාවිතා කිරීමට අවශ්‍ය අමතර කොටස් හා උපාංග අදාළ යන්ත්‍රය මිලදීගත් කාලසීමාවේදීම මිලදී ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට නොහැකි වී ඇති බැවින් අදාළ යන්ත්‍රය අයිස් කප් පිරවීම සඳහා පරිවර්තනය කිරීමේ හැකියාව පිළිබඳ සමාගම විසින් මේ වන විට සොයාබලමින් පවතී. තවද රු මිලි.809 කට අධික දිගන කර්මාන්තශාලා නවීකරණය කිරීමට අදාළ මූල්‍ය වියදම ප්‍රග්ධනිත කිරීම සඳහා ඊට අදාළ වත්කම් වල වටිනාකම් හඳුනාගැනීම සඳහා සමාගම විසින් මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර,එම කමිටුව මගින් ලබාදෙන වාර්තා මත අදාළ වත්කම් ප්‍රාග්ධනිත කිරීමට බලාපොරොත්තු වේ. | ඉදිකිරීම් හා නවීකරණ කටයුතු නිම කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ නිෂ්පාදන වර්ග 03 ක් ඒකකයක නිෂ්පාදිත පිරිවැයට වඩා අඩු මිලට අලෙවි කිරීම හේතුවෙන් රු.35,927,758 ක අලාභයක් සිදු වී තිබුණි. | අදාළ චීස් නිෂ්පාදනයෙහි වෙළඳපල මිල තීරණය කිරීමේදී අනෙකුත් තරගකාරී නිෂ්පාදනවල මිල සලකා බැලීමට සිදුවීම මෙන්ම නිෂ්පාදනය විකිණීමේදී අදාළ වෙළඳ අතරමැදියන් සඳහ ලබා දියයුතු ලාභාන්තිකය (PROFIT MARGIN) උපරිමව ලබා දීමට සිදුවීමත් , අදාළ නිෂ්පාදනය | පිරිවැය සහ ලාභාන්තිකයක් සහිත මිලට අලෙවි කිරීම තුළින් ආයතනයේ අලාභ අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා අඩු ඉල්ලුමක් පැවතීම හේතුවෙන් අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමත් සිදු කරනු ලබයි. ඒ අනුව ඉහත සාධකවල බලපෑම මත මෙවැනි තත්වයක් උද්ගත වී ඇත. අදාළ බටර් නිෂ්පාදනය සුභසාධන පදනමින් සමාගමේ සේවකයින් සඳහා පමණක් කළමනාකාරීත්වයේ අනුමැතිය සහිතව ලබාදෙන අයිතමයක් වන අතර ඉදිරියේදී අදාළ නිෂ්පාදිතයේ මිල වෙනසක් සිදුකිරීමට බලාපොරොත්තුවේ. | |
| (ආ) | 2024 වර්ෂයේ යෝගට් මිලි ලීටර් 80 සහ UHT කිරි මිලි ලීටර් 180 (Ultra High Temperature Milk) නිෂ්පාදිතයන් හි අපේක්ෂිත විකුණුම් පිළිවෙලින් ඒකක 120,018,000ක් සහ ඒකක 23,100,000ක් වුවද සත්‍ය විකුණුම් ප්‍රමාණය පිළිවෙලින් ඒකක 81,649,414ක් සහ ඒකක 19,414,484ක් වූයෙන් අපේක්ෂිත විකුණුම් ලඟාකරගැනීම පිළිවෙලින් සියයට 68 සහ සියයට 84 ක් වී තිබුණි. | පොළොන්නරුව කර්මාන්තශාලාවේ UHT නිෂ්පාදන යන්ත්‍රයේ හදිසි බිඳවැටීම හේතුවෙන් මාස කිහිපයක් යනතුරු අදාළ UHT 450 ml හා 900ml නිෂ්පාදන දිගන කර්මාන්තශාලාවේ සිදුකිරීම හේතුවෙන් දිගන කර්මාන්තශාලාවේ UHT 180ml අයිතමය සීමා වීමය. තවද දිගන කර්මාන්තශාලාවේ අක්‍රියව පැවති කල්කිරි නිෂ්පාදන යන්ත්‍රය 2024 වසර තුලදී අලුත්වැඩියා කර ඒ වන විට අධික ඉල්ලුම පැවති කල්කිරි නිෂ්පාදන කටයුතු ආරම්භකළ බැවින් UHT යන්ත්‍රය හා කල්කිරි යන්ත්‍රය එකවර නිෂ්පාදනයට යෙදවීමට නොහැකි වීම මත UHT නිෂ්පාදනය අඩුවිය. එසේම අයවැයගත යෝගට් ප්‍රමාණයට වඩා විකුණුම් ඒකක අඩුවීමට බඩල්ගම කර්මාන්තශාලාවේ මෙහෙයුම් ආරම්භ නොවීම බලපාන ලදී. කෙසේවෙතත් අනෙකුත් කර්මාන්තශාලාවල යෝගට් නිෂ්පාදන යන්ත්‍ර පූර්ණ වශයෙන් උපයෝජනය කළත් අයවැයගත ඉලක්ක ලඟාකරගත නොහැකි විය. | අපේක්ෂිත විකුණුම් ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු අතර මෙහෙයුම් දුර්වලතා මඟහරවාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන මගින් මිලදීගත් අමු කිරි කර්මාන්තශාලාවලට භාරදීමේදී මිල දී ගත් අමුකිරි තුළ අඩංගු FAT සහ SNF ප්‍රමාණයට වඩා අඩු FAT සහ SNF ප්‍රමාණයක් අඩංගු වී තිබීම හේතුවෙන් 2024 වර්ෂයේ දී කිරි ගොවීන්ට ගෙවීම් කිරීමේදී කර්මාන්තශාලා විසින් භාරගත් | මෙම වෙනසට හේතුවී ඇත්තේ ඇතැම් අවස්ථාවන් වලදී කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන මගින් කර්මාන්තශාලා වෙත පිටත් කරනු ලබන කිරි තොගවල ලීටර ප්‍රමාණය හා එහි ගුණාත්මකභාවය (FAT/SNF) අදාළ කර්මාන්තශාලා වෙතින් භාරගැනීමේදී විචලනය වීමට ලක්වීම නිසා ඇතිවන අලාභ තත්වය වේ. | අමුකිරි තුළ අඩංගු FAT සහ SNF අඩුවීමට හේතු හඳුනාගෙන අලාභ අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමිතියට වඩා අඩු ප්‍රමිති තත්වයක් සඳහා රු.46,463,371ක වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි. | | |
| (ඈ) | නිෂ්පාදනයට නුසුදුසුවීම හේතුවෙන් අඹේවෙල කර්මාන්තශාලාවේ විනාශ කරන ලද කිරි ලීටර් 54,128ක වියදම වූ රු. 9,622,834ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි වෙනත් වියදම් තුළ ඇතුළත්ව තිබුණු අතර එම වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 249 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි. | මෙම ඉවත්කිරීම් සඳහා වගකිව යුතු අදාළ පාර්ශව අභ්‍යන්තර පරීක්ෂණ මගින් හඳුනාගෙන එම පාර්ශව වෙතින් අදාළ වටිනාකම් අයකරගැනීමට කටයුතු කරනු ලබයි. | නිෂ්පාදනයට සුදුසු කිරි ලබාගැනීමට නිර්ණායක තව දුරටත් සංවර්ධනය කර ඒ අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලසීමාව තුළ දිගන සහ පොලොන්නරුව කිරි කර්මාන්තශාලා මගින් අඛණ්ඩව අලාභ වාර්තා කර තිබුණු අතර එම වර්ෂවල අලාභයන්ගේ එකතුව පිළිවෙලින් රු.908,377,135ක් සහ රු.226,973,992ක් වී තිබුණි. කොළඹ කිරි කර්මාන්තශාලාවේ 2023 වර්ෂයේ රු.23,092,669ක්ව පැවති අලාභය 2024 වර්ෂයේ දී රු.150,413,535ක ලාභයක් ලෙස වර්ධනය තිබුණ ද, 2024 වර්ෂයේ දී ණය පදනම මත අලෙවිය වර්ධනය වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | 2024 වර්ෂයේ අමු කිරි එකතු කිරීම වැඩිවුවද, දිගන සහ පොලොන්නරුව කර්මාන්තශාලා ප්‍රශස්ත ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මීට බලපෑවේය. | අලාභ ලබන කර්මාන්තශාලාවල ධාරිතා උපයෝජනය වර්ධනය කර ලාභ ලබන තත්වයට පත්කළ යුතුය. |
| (ඊ) | 2021 වර්ෂයේ ලීටර් 20,705,024 ක් වූ දියර කිරි නිෂ්පාදනය අඛණ්ඩව පහත වැටී 2024 වර්ෂය වන විට ලීටර් 11,039,432 දක්වා සියයට 47 කින් පහත වැටී තිබුණි. තවද අදාළ කාල කාලසීමාව තුළ යෝගට්, අයිස්ක්‍රීම්, බටර්, කිරිපිටි සහ උකුකිරි යන නිෂ්පාදනවල නිෂ්පාදන ප්‍රමාණය සියයට 42 ත් සියයට 09ත් අතර පරාසයකින් අඩු වී තිබුණි. කෙසේ වෙතත් කිරිපිටි, බටර්, Sterilized කිරි, සහ උකුකිරි යන නිෂ්පාදනවල පමණක් නිෂ්පාදන ප්‍රමාණය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 98ත් සියයට 12 ත් අතර පරාසයකින් වැඩි වී තිබුණි. | කිරි සහ සැකසූ කිරි නිෂ්පාදන සඳහා පැවති වැට් බදු නිදහස් කිරීම ඉවත්කර බදු අනුපාතය සියයට 18 දක්වා වැඩි කිරීම හේතුවෙන් 2024 ජනවාරි මාසයේදී මිල ගණන් ඉහළ දැමීමට සිදුවීම හේතුවෙන් පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවී ඉල්ලුම පහත වැටී නිෂ්පාදන පිරිවැය ද වැඩිවිය. ඒ අනුව, 2024 වර්ෂයේදී අමු කිරි එකතු කිරීම ඉහළ ගියද පාරිභෝගික ඉල්ලුම පහත වැටීම හේතුවෙන් යෝගට් සහ UHT කිරි ඇතුළු කල් තබා ගැනීමේ කාලය අඩු අනෙකුත් නිෂ්පාදන සීමා කිරීමට සිදුවිය. | වෙළඳපොළ තත්වයන්ට අනුව පාරිභෝගික මිල දී ගැනීමේ හැකියාව සැලකිල්ලට ගෙන වෙළඳ පොළට නිෂ්පාදන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ළ) | පාස්චරිත කිරි, Sterilized කිරි, UHT කිරි, බටර්, අයිස්ක්‍රීම්, එළඟිතෙල් සහ කිරිපිටි යන නිෂ්පාදන සිදුකිරීම සඳහා කර්මාන්තශාලා සතුව පවතින නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 50කට අඩු ධාරිතාවක් උපයෝජනය කර තිබුණු අතර යෝගට්, මුදවපු කිරි සහ උකුකිරි යන නිෂ්පාදන සිදුකිරීම සඳහා කර්මාන්තශාලා සතුව පවතින නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 50ත් සියයට 75ක් අතර ප්‍රමාණයක් පමණක් භාවිතා කර තිබුණි. චීස් නිෂ්පාදන කටයුතු දිගන කර්මාන්තශාලාවේ පමණක් සිදු කරන අතර එය සියයට 88 ධාරිතාවයට ළඟා වී තිබුණ ද උපරිම ධාරිතාවය භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අමු කිරි එකතු කිරීම යම් ප්‍රමාණයකින් වර්ධනය වුවද, නිෂ්පාදන ධාරිතාවන් ප්‍රශස්ත ලෙස හෝ උපරිම මට්ටමකින් උපයෝජනය කිරීමට එය ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, පැවති සීමිත කිරි ප්‍රමාණය වෙළෙඳපොළ ඉල්ලුමට අනුකූලව එක් එක් නිෂ්පාදන වර්ග අතර බෙදාහරිමින් නිෂ්පාදන කටයුතු සිදු කර ඇත. | සමාගමේ නිෂ්පාදන ධාරිතාවය ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීමට හැකිවන පරිදි දියර කිරි එකතු කිරීම ප්‍රවර්ධනය කළ යුතු වේ. |
| (ළු) | 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් 13,258,335 සිට ලීටර් 10,779,407 දක්වා සියයට 19 කින් අඩු වී තිබුණි. තවද පාස්චරිත කිරි, UHT කිරි, යෝගට්, අයිස්ක්‍රීම් සහ චීස් නිෂ්පාදිතවල විකුණුම් ප්‍රමාණ සියයට 07 ත් සියයට 40ක් අතර පරාසයක් තුළ අඩු වී තිබුණි. | නිෂ්පාදනයට සාපේක්ෂව විකුණුම් ප්‍රමාණයන් ද අඩුවිය. 2024 වර්ෂයේ ආරම්භයේදී වැට් (VAT) බදු පැනවීම හේතුවෙන්, යෝගට් එකක මිල එකවර රුපියල් 10කින් සහ අයිස්ක්‍රීම් මිල සැලකිය යුතු මට්ටමකින් ඉහළ දැමීමට සිදු විය. මේ හේතුවෙන් යෝගට් සහ අයිස්ක්‍රීම් සඳහා ඊට පෙර පැවති ඉහළ ඉල්ලුම ශීඝ්‍රයෙන් පහත වැටුණි. | සමාගමේ වෙළඳපොළ කොටස ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 ඡේදය අනුව සමාගම විසින් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 03 සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර ඒ අනුව 2024 වර්ෂය සඳහා සිදුකිරීමට අපේක්ෂිතව තිබූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි. | ආයතනය විසින් ක්‍රමවත් ප්‍රසම්පාදන වාර්තාවක් මින් පෙර ඉදිරිපත් කර නොතිබූ අතර පළමු වරට 2024 වර්ෂය තුළදී 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රමවත්ව සිදුකිරීමට කටයුතු යොදනු ලැබීය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර | ප්‍රසම්පාදන සැලැස්ම අනුව කාලසටහන මින් ඉදිරියට සකස් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු සිදු කළ යුතුය. |

ක්‍රමානුකූලව විස්තර කරන කාලසටහනක් සකස් කළ යුතු වුවද 2024 වර්ෂය සඳහා එවැනි කාලසටහනක් සකස් කර නොතිබුණි.